# ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය

## ජල සම්බන්ධනයක් සඳහා පාරිභෝගිකයා බැඳෙන ගිවිසුම

1974 අංක 2 දරණ ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ හා 1992 අංක 13 දරණ සංශෝධන පනතේ සඳහන් කොන්දේසි වලට හා පසුව රජය විසින් හෝ ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් පනවනු ලබන කවර කොන්දේසි වලට හෝ අනුකූලවීමටත්,යම් හෙයකින් එසේ පැනවෙන කොන්දේසි හා බදුවලට අනුකූලවීමට මා අසමත් වුවහොත්, ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ අභිමතය පරිදි කවර අවස්ථාවකදී වුවද , මෙම සම්බන්ධනය විසන්ධි කරනු ලැබීමට යටත් වන බවට සම්පූර්ණ දැනුම ඇතිව සිටිම්/සිටිමු. තවද හිඟ මුදල් අයකර ගැනීම සඳහා මා/අප/දෙපාර්තමේන්තුව/ අමාත්‍යංශය/ආයතනය/ හට විරුද්ධව නීතිමය පියවර ගැනීමට ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලයට අයිතියක් ඇති බවත් , එම නීතිමය තීරණ හා කොන්දේසි වලට අනුකූලව කටයුතු කිරීමටත්, ------------------------------------------------------------------------------------------------------------------------------------------------------------------------පදිංචි------------------------------------------------------------------------------------------------------------- වන මම/අප ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලයෙන් ----------------------------------------------------------------------------------------------------------------------------------------------යන ස්ථානයට ජල සම්බන්ධනයක් ලබාගැනීමට එකඟ වෙම්/වෙමු .

**(ඉහත පනත්වල සඳහන් සමහර රෙගුලාසි සහ නියෝගවල අන්තර්ගත කොන්දේසි වඩා පැහැදිලි වන ලෙස මෙසේ දක්වා ඇත. එහෙත් එවා සම්පූර්ණමය නොවන අතර පාරිභෝගිකයින්ගේ පහසුව සඳහා පමණක්ම වේ).**

### ජල සැපයුම පිළිබඳ කොන්දේසි

1. සපයනු ලබන ජලය අපතේ නොයැවීමට හා අයථා පරිදි පාවිච්චි නොකිරීමට වග බලා ගත යුතුය.
2. ආයතනයක වැඩි දියුණු කිරීම සඳහා කොන්ත්‍රාත්කරු වෙත ලබා දෙන ජල සැපයුමක් නම් එය තාවකාලික ජල සැපයුමක් වන අතර , මාස 6 න් ජල සැපයුම විසන්ධි කිරීමට යටත්වන හෙයින්, නැවත ජල සැපයුම අවශ්‍ය නම් නව ගිවිසුමකට එළඹ එය ලබා ගත යුතුය.
3. ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ සාමාන්‍යාධිකාරී විසින් ජල සැපයුම් හා සම්බන්ධ කාර්යයක් සඳහා බලය දෙන ලද කවර නිළධාරියෙකුට වුවද සියලු අභ්‍යන්තර ජලනල හා සවි කරන ලද උපකරණ පරීක්ෂා කර බැලීමට කවර සාධාරණ වෙලාවක වුවද ඉඩ පහසුකම් ලබා දිය යුතුය.
4. නිවාස පරිභෝජන හා අන් සම්බන්ධන වලදී රජයේ දේපළක් වශයෙන් පවතින ජල මනුවේ පරිභෝජනයට අනුකූලව ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ සාමාන්‍යාධිකාරීට ගෙවිය යුතුවන ජල ගාස්තු ගෙවිය යුතුය.
5. ජල සැපයුම් ලබා දීම සඳහා ප්‍රධාන නලයේ සිට ජල මනුව දක්වා අවශ්‍ය සියලුම ද්‍රව්‍ය සඳහා යනු ලබන වියදම් මණ්ඩලය විසින් සකස් කරනු ලබන වියදම් ඇස්තමේන්තුවට ඇතුළත්ව ඇති අතර **මේ සඳහා පරිභෝගිකයා විසින් සපයනු ලබන කිසිදු ද්‍රව්‍යයක් භාර ගනු නොලැබේ.** මෙම ඇස්තමේන්තුව සඳහා පාරිභෝගිකයා මුදල් යෙදෙව්වද එය මණ්ඩලය සතු දේපළ වශයෙන් පවතී. වෙනත් පාරිභෝගිකයෙකුට ජල සැපයුම ලබා දීම සඳහා එම උපකරණ හා නල මාර්ග යොදා ගැනීමේ අයිතිය මණ්ඩලය සතු වේ. ඒ අනුව මණ්ඩලයේ සේවකයන් හැර වෙනත් කිසිම අයෙකු කුමන හේතුවක් මත හෝ එම උපකරණ වලට හෝ නළ මාර්ග වලට කිසිවක් නොකළ යුතුය.
6. ඉහත සඳහන් උපකරණ හා නල නැතිවුවහොත් විනාශ වුවහොත් නැත්නම් එවාට අලාභහානි සිදුවුවහොත් පාරිභෝගිකයා ඒ බව මණ්ඩලයට දැනුම් දිය යුතු අතර, එම අලාභ හානිය උපකරණ දෝෂ නිෂ්පාදන තත්වයේ හේතුවෙන් සිදු වී ඇති අවස්ථාවල හැර එවැනි හානි වු භාණ්ඩ අලුත්වැඩියා කිරීමට හෝ නැවත සැපයීම සඳහා යන සියලු වියදම් පාරිභෝගිකයා විසින් මණ්ඩලයට ගෙවිය යුතුය.
7. ජල මනු කියවීම සඳහා පැමිණෙන නිළධාරීන්ට මනු කියවීමට අදාල පහසුකම් සලසා දිය යුතු අතර,යම්කිසි අවස්ථාවකදී ජල මනුව ක්‍රියා විරහිත වීමෙන් හෝ සටහන් ගැනීම සඳහා මණ්ඩලයේ නියෝජිතයන්ට මනුව වෙත යා නොහැකි නම් හෝ කිසියම් නොවැලැක්විය හැකි හේතුවක් මත හෝ ඇස්තමේන්තු බිල්පත් නිකුත් කිරීමට සිදුවුවහොත් මණ්ඩලයේ නීති රීති වලට අනුකූලව ඇස්තමේන්තු බිල්පත් ඔබ වෙත ඉදිරිපත් කරනු ලැබේ.
8. මණ්ඩලය සතු ජල මනුවෙන් පසුව සවිකර ඇති කිසියම් ජල නලයක් හෝ උපකරණ නඩත්තු කිරීමේ වගකීම මණ්ඩලය භාර ගනු නොලැබේ.
9. මණ්ඩලයේ අනෙකුත් පාරිභෝගිකයන්ට කාර්යක්ෂම ලෙස ජලය සැපයීමට බාධාවන ලෙස අනිසි අයුරින් සැපයුමට බාධා කිරීම හෝ පීඩනය වැඩි කිරීම සඳහා මණ්ඩලීය නලයට පොම්ප සවිකිරීම වරදකි. එසේ සිදුකළහොත් අදාල ජල සැපයුම විසන්ධි කිරීමට මණ්ඩලයට බලය ඇති අතර ඒ සඳහා මණ්ඩලය මගින් නියම කරනු ලබන **දඩයකට යටත් වීමටද සිදුවනු ඇත.**
10. එක් එක් අය ක්‍රමයන් යටතේ තමාට ලබා දී ඇති ජල සැපයුම අධි අයකිරීම් ක්‍රමයක් ක්‍රියාත්මකව පවත්නා කවර හෝ කාර්යයන් සඳහා පාරිභෝගිකයා විසින් භාවිතා නොකළ යුතුය. කිසියම් පාරිභෝගිකයෙකුට ජල සැපයුම අධි අය ක්‍රමයකට යටත් වන පරිදි වෙනස් කලේ නම් මණ්ඩලය විසින් තීරණය කරනු ලබන පරිදි එබදු අධි අය ක්‍රමයකට යටත්විය යුතු දිනයේ සිට එකී අය ක්‍රමය යටතේ ජල ගාස්තු ගෙවීමට පාරිභෝගිකයා බැඳී සිටිනු ඇත.
11. ජල සැපයුම සඳහා ගෙවිය යුතු මුදල අයපත් මගින් දන්වා යවනු ලැබූ විට ගෙවීමට බැඳී සිටින අතර එසේ සම්පූර්ණයෙන් නොගෙවුවහොත් හෝ මෙහි සඳහන් ජල සැපයුම් පිළිබඳ කොන්දේසි කිසිවක් උල්ලංඝනය කරනු ලැබුවහොත් ජල සැපයුම සිඳලීමේ අයිතිය මණ්ඩලය සතු වේ. මෙම ජල සම්බන්ධනයට අමතරව තවත් ජල සම්බන්ධන ඇත්නම් එවා විසන්ධි කර පසු හෝ පෙර හිඟ මුදලක් ඇත්නම් මෙම ජල සම්බන්ධනය අදාල ගිණුමෙහි හෝ මෙම ස්ථානයට අදාල වෙනත් ගිණුමක හිඟයක් නොමැති වුවද එම ජල සැපයුම/ සැපයුම් විසන්ධි කිරීමට මණ්ඩලයට බලය ඇත.
12. ජල පාරිභෝගිකයා නිවාස හිමියා හෝ වෙනත් අයෙකු වුවද මෙයට අදාල ජල සැපයුම නැවත ලබා දෙන්නේ නම් එසේ කිරීමට කටයුතු කරනු ලබන්නේ ඒ සඳහා වැයවෙන සියලුම වියදම් හා හිඟ ගාස්තු සියල්ල පාරිභෝගිකයා විසින් ගෙවීමට කටයුතු කිරීමෙන් පසුව පමණි.
13. මණ්ඩලය විසින් තමාට සපයා දී ඇති ජල සැපයුම පාරිභෝගිකයා විසින් අනිසි අන්දමින් භාවිතා කිරීමට හා සපයා ඇති ජල සැපයුමෙන් කොටසක් වෙනත් අයෙකුට සැපයීම හෝ විකිණීම දඩුවම් ලැබිය හැකි වරදකි. මෙහිදී මණ්ඩලයේ ක්‍රියාපටිපාටි අනුව දඩ මුදලක් අය කරනු ලැබේ.
14. ජල සැපයුම අවසන් කර ගැනීමට යම් පාරිභෝගිකයෙකුට අවශ්‍ය වු විට ඒ බව යටත් පිරිසෙයින් සතියකට කලින් ලිඛිතව දැනුම් දිය යුතු අතර සැපයුම සිඳලන දිනය දක්වා සපයනු ලබන ජලය සඳහා ගෙවීම් කිරීමට පාරිභෝගිකයාට සිදුවනු ඇත.
15. ජල බිල්පත් නිසි පරිදි ගෙවා නොමැති අවස්ථාවලදී ජල සැපයුම විසන්ධි කිරීමේ දැන්වීම බිල්පතේම මුද්‍රණය කර හෝ තැපෑලෙන් හෝ එම ස්ථානයේ අලවා හෝ අදාල පාරිභෝගිකයා දැනුවත්කර, විසන්ධි කිරීමට යන අවස්ථාවේදී අදාල පුද්ගලයන් සිටින/නොසිටින අවස්ථාවන්හිදී ජල සැපයුම මීටරයෙන් / ප්‍රධාන නළයෙන් විසන්ධි කිරීම හෝ පොලිසිය සමග අදාල පරිශ්‍රයට ඇතුල්වී ජල සැපයුම විසන්ධි කිරීමට බලය මණ්ඩලය සතු වේ.
16. මුලික ඉඩම කොටස් වලට බෙදා , නව වරිපනම් අංක දෙන ලද අවස්ථාවක , අයිතිකරු විසින් එහි නව වරිපනම් අංක හා නව අයිතිකරුවන්ගේ තොරතුරු මණ්ඩලයට ලිඛිතව දැනුම් දිය යුතුයි. එසේ කිරීමට අපොහොසත් වුවහොත්, කිසිම වගකීමකින් තමා නිදොස් නොවේ. මුල් ඉඩම හෝ ඉන්පසු වෙන්කළ කොටසක් අන්සතු කළාට පසුව මුල් ඉඩමෙහි මණ්ඩලයට අයවිය යුතු හිඟයක් වේ නම් එම හිඟය ගෙවීමට බැඳී සිටින බව දැනුවත්ව සිටිය යුතුය.
17. අදාල ජල සැපයුම ඇති ස්ථානය විකුණනු ලැබුවහොත් නව අයිතිකරු විසින් ඇප තැන්පතුවක් ගෙවීමෙන් අනතුරුව නව ගිවිසුමක් අත්සන් කළ යුතු අතර එසේ නොකළහොත් එම ජල සැපයුම විසන්ධි කිරීමට බලය මණ්ඩලය සතුය.
18. ජල සැපයුම මාපකයෙන් විසන්ධි කිරීමෙන් පසු එය ප්‍රධාන නළයෙන් විසන්ධි කිරීමට මණ්ඩලයට බලය ඇති අතර,එම ජල සැපයුම විසන්ධි කර දින 365 ක් ඇතුළත නැවත සන්ධිකර නොගත්තද පසුව එම ජල සම්බන්ධනය තමාට අවශ්‍ය වන්නේ නම් ඒ බව ලියාපදිංචි තැපෑලෙන් විසන්ධිකර දින 365ක් ඇතුළත දන්වා එවිය යුතුය. ගිණුම අවලංගු කිරීමෙන් පසු නැවත ජල සැපයුම අවශ්‍යනම් නව ජල සැපයුම් ගාස්තු හා පෙර ගිණුමේ හිඟ මුදල් ගෙවා ජල සම්බන්ධනය ලබා යුතුය.
19. ප්‍රසිද්ධ දැන්වීමක් මගින් හෝ පාරිභෝගිකයාට ලිඛිත දැනුම් දීමෙන් පසු ජල සැපයුම පිළිබඳ ඉහත සඳහන් කොන්දේසි වලින් සමහරක් හෝ නැතහොත් අය ක්‍රමය යටතේ වු ගාස්තු කලින් කලට සංශෝධනය කිරීමට හෝ වෙනස් කිරීමට මණ්ඩලයට හැකිවේ. එබදු සංශෝධන හෝ වෙනස් කිරීම් හෝ එකී දැනුම් දීමේ සඳහන් දිනයේ සිට ක්‍රියාත්මක වේ.
20. මණ්ඩලයේ සේවා නළයේ සිට ජල මනුව දක්වා ඇති ජල නල පද්ධතිය අවහිර වන සේ හෝ හිතා මතා හෝ යම් නීතිමය හේතුවක් මත අවහිර වන්නේ නම් එම ජල සම්බන්ධනය විසන්ධි කිරීමේ බලය මණ්ඩලය සතුවේ.
21. ජල සැපයුම ලබා ගැනීමේදී ඉදිරිපත් කරන ලියවිලි හා අනිකුත් විස්තර නිවැරදි හා සත්‍ය ලෙස ඉදිරිපත් කිරීමට බැඳී සිටින අතර, එම විස්තර ව්‍යාජ හා/හෝ සාවද්‍ය බවට පසු කලෙක තහවුරු වුවහොත් මෙම ජල සැපයුම ප්‍රධාන නලයෙන් විසන්ධි කිරීමට ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලට බලය ඇත.

**---------------------------------------------------------------- වන මම/අප ඉහත සඳහන් කොන්දේසි සියල්ල කියවා තේරුම් ගත් බවත්, එම කරුණු සියල්ල හා වරින් වර පනවනු ලබන කවර හෝ කොන්දේසි වලට හෝ අනුකූලව ක්‍රියාකිරීමට එකඟ වන බවත් මෙයින් ඔබ වෙත දන්වා සිටිම්/සිටිමු.**

2 පිටුවට...........

**A** ගෘහ අයිතිකරු/බදුකරු/කුලීකරු (අනවශ්‍ය දෑ කපා හරින්න).

1. අයදුම්කරුගේ සම්පූර්ණ නම : ..............................................................................................................
2. සේවා ලිපිනය : ..................................................................................................................
3. අයදුම්කරුගේ අත්සන : ......................................
4. ජාතික හැඳුනුම්පත් අංකය : ...................................... දිනය : ...................................

---

**B** ගෘහ නොවන ගෘහ ව්‍යාපාරයේ / සමාගමේ /ආයතනයේ / හවුල් ව්‍යාපාරයේ නම (අනවශ්‍ය දෑ කපා හරින්න).

1. සේවා ලිපිනය : ..............................................................................................................

සමාගමක් නම් අධ්‍යක්ෂකගේ / ව්‍යාපාරයක් නම් අයිතිකරුගේ / රජයේ ආයතනයක් නම් එහි ප්‍රධානියාගේ හෝ බලයලත් නිලධාරියාගේ

සම්පූර්ණ නම : ..............................................................................................................

අත්සන : ...................................

ජාතික හැඳුනුම්පත් අංකය : ................................... දිනය : ...................................

2. සේවා ලිපිනය : ..............................................................................................................

සමාගමක් නම් අධ්‍යක්ෂකගේ / ව්‍යාපාරයක් නම් අයිතිකරුගේ / රජයේ ආයතනයක් නම් එහි ප්‍රධානියාගේ හෝ බලයලත් නිලධාරියාගේ

සම්පූර්ණ නම : ..............................................................................................................

අත්සන : ...................................

ජාතික හැඳුනුම්පත් අංකය : ................................... දිනය : ...................................

---

**C** අවශ්‍ය නම් පමණක්

20.............................. මස .......................දින
මා ඉදිරියේ දිවුරන ලදී.

දිවුරුම් කොමසාරිස් / සාමදාන විනිශ්චයකාර

සම්පූර්ණ නම :

ලිපිනය :

මුද්‍රාව :

සාක්ෂිකරුවන්

01. සම්පූර්ණ නම : .................................................

ජාතික හැඳුනුම්පත් අංකය : .......................................

අත්සන : ..................... දිනය : ..................

02. සම්පූර්ණ නම : .................................................

ජාතික හැඳුනුම්පත් අංකය : .......................................

අත්සන : ........................ දිනය : ...............

---

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා

මණ්ඩලයේ බලයලත් නිලධාරියාගේ සම්පූර්ණ නම :

තනතුර : -----------------------

අත්සන : ----------------------- දිනය : ---------------------

මුද්‍රාව :